# ඇඩ්ස් 10

ජගත් ජේ එදිරිසිංහ ලියයි



ෆාතිමා ගේ ගේ අද්දරින් පටු මාවතට බට සුනන්ද බාගත් හිසින් ඉදිරියට යයි. අඩි හතරක් පහක් පළල මාවතේ එක් පසෙකින් ගලා යන කානුවේ පල් ගඳ තදින් දැනෙයි. තමා මේ මගෙහි යන්නේ බොහෝ කාලයකට පසු බව සුනන්දට සිහිපත් වෙයි.

විවරව ඇති දොරකින් හිස එළියට දමනා ගැහැණියක් හෝ මිනිසෙක් හෝ සුනන්ද හා සිනාසෙයි. වරින් වර ඉදිරියෙන් එන්නෝ පසෙකට වී ඔහුට ඉඩ දෙති. පටු කානුවේ දෙපසට පා තබා වාඩි වී මළ පහ කරමින් සිටින කොලු පැටියා සුනන්ද දෙස හැරී බලයි. ඇතැම් නිවසක මහ හඬින් වාදනය වන ගීයක හඬ කන්දොස්කිරියාවක් සේ දැනෙයි.

අතුරු මාවත් කීපයක් පසු කරන සුනන්ද බන්ඩාර ගේ ලෑලි ගෙදර ඉදිරියේ නවතියි. ගෙතුළින් එකිනෙකා පරයා කතා කරන පිරිමි කටහඬ කීපයක් ඇසෙයි. සුනන්ද රතු රෑලි කඩදාසියෙන් සැරසුණ උලුවස්සට දෑත් තබා ඇතුළට එබී බලයි. අවුරුද්දකට පමණ පෙර මේ නිවහනට ගොඩ වැදුණ දිනයේ සාලයේ බිත්තියේ අලවා තිබූ විජේවීර ගේ සේයාරුව තවමත් එතැනම ය. වෙනසකට ඇත්තේ එය මඳක් අව පැහැ ගැන්වී තිබීම පමණකි. ඒ දෙපසින් අලවා ඇති ලෙනින් ගේ සහ මාක්ස් ගේ සේයා රූ දෙක ද එදා තිබූ ලෙසම ය.

සාලයේ මුල්ලක ගොඩ ගසා ඇති ඩිමයි කඩදාසි ගොන්න අසළම අපිළිවෙළට දැමූ පෝස්ටර ගොඩකි. ඒ මත වැතිර සිටි බළලා සුනන්ද දුටු සැණින් නැගිට ගෙතුළට දුවයි.

"සුනන්දයියා..." බණ්ඩාර තනි කාමරයේ දොර අසළ සිට කෑ ගසයි. ".. එන්ඩ.. එන්ඩ ඇතුළට.."

සුනන්ද හිස පහත් කර මිටි උලුවස්සෙන් ගෙට ඇතුල් වෙයි.

"අතුල සහෝදරයා ඔය පුටුවක් ගේන්ඩ.." බණ්ඩාර කාමරය තුළ සිටියෙකුට කියයි. ඒ පුටුව සුනන්ද සඳහා ය.

සුනන්ද වාඩි වත්ම කිසිවෙක් කහට තේ වීදුරුවක් සහ හකුරු කැබලි කීපයක් සහිත දීසියක් ඔහු වෙත දිගු කරති.

"අපි තේ බිබී හිටියෙ.." බණ්ඩාර කියයි. සුනන්ද වීදුරුව අතට ගන්නේ බණ්ඩාරගේ මුහුණ බලාගත්වන ම ය. නිදි වැරීම නිසා රත් පැහැ ගත් බණ්ඩාරගේ දෑස ඝනව වැඩුණ රැවුල අතර කැපී පෙනෙයි.

"සුනන්දයියෙ ඊයෙ රැස්වීමට ආවෙ නෑ නේද..? මං හිතුව එයි කියලා.. "

සුනන්ද පිලිතුරක් නොදෙයි. බණ්ඩාර ඩිමයි කඩදාසි මිටිය මත ඩාවි වී ලෑලි බිත්තියට පිට වාරු කරයි. දෑස් පියාගෙන මොහොතක් සිටින ඔහු රණසිංහ ගේ මුහුණ දෙස බලයි. ඔහු බොහෝ වෙහෙසව සිටින්නේ යයි සුනන්දට සිතෙයි.

".. මේ මගුල් සන්ධාන ගැහිල්ල නිසා අපටත් සිද්ද වුණානෙ මේ පරයන්ට නැගල බයිල කියන්න ස්ටේජ් ගහන්න.. අම්මපා මගේ ඇගේ මාලු නැටුවා ඊයෙ හවස.. " බණ්ඩාර කියන්නේ නොසැඟවූ කෝපයෙනි.

"..නායකයො තීරණ ගන්නවා.. අපිත් හරක් වගේ ඒව ක්‍රියාත්මක කරනවා.."

පෙරදා සවස් වරුවේ සන්ධානයේ රැස්වීම බලන්නට යන්නට අදහසක් සුනන්ද තුළ නොවී ය. දහවල් කාලයේ සිට වත්තේ කොලු රෑන පිරිවරාගත් බණ්ඩාර රැස්වීමේ වැඩ කටයුතු සංවිධානය කරමින් ඒ මේ අත දුවනු සුනන්ද දුටුවේය. ඔවුන් අතින් ඉදිවුන වේදිකාව මත සිට රණසිංහ වේගවත් කතාවක් කරනු සුනන්ද බලා සිටියේ කිසිවකුට නොපෙනෙන මානයේ සිට ය.

දූෂණය භීෂණය නිමා කර අලුත් රටක් ගොඩ නගන්නට සන්ධානයට ඡන්දය දෙන්නැයි රණසිංහ ඉල්ලා සිටින විට නැගුණ අත්පොළසන් හඬ සුනන්ද තුළ ඇති කළේ විමතියකි. මේ කතා කරන මිනිසා පසුගිය වසර කීපයේ පාර්ලිමේන්තුව තුළට වී කළේ කුමක් දැයි සිතන්නට තරම් මොළයක් මේ මිනිසුන්ට නැති වීම මහා අභාග්‍යයක් නොවේ දැයි සුනන්දට සිතුණි. මේ තරම් පහසුවෙන් මිනිසුන් රැවටිය හැකි ද? ආසියාවේ ඉහළම සාක්ෂරතාව ඇති රට ශ්‍රී ලංකාව යයි ඉගෙන ගත් බවක් මතකය. සාක්ෂරතාව හා බුද්ධිය අතර සම්බන්ධයක් තිබිය නොහැකි යයි සුනන්දට සිතෙයි.

".. අපිට මේ දේවල් නොතේරෙනව නෙවෙයි සුනන්දයියා.. අපි බලන්නෙ මේ වෙලාවෙ කර අරින්නෙ නැතුව මාන්සි වෙලා අපේ සහෝදරවරු දහ පාළොස් දෙනෙක් වත් පාර්ලිමේන්තුවට යවා ගන්න.. මේ මනාප ක්‍රමය කියන පිස්සු කෙළියෙන් වාසියක් ගන්න... එහෙම වුණොත් මුන්ට ඕනෙ ඕනෙ විදිහට නටන්න ඉඩක් ලැබෙන්නෙ නැහැ.. අර සහෝදරය කියනව වගේ රිමෝට් කන්ට්‍රෝල් එක අපේ අතට ගන්න.. අන්න ඒකටයි මේ දුක් විඳගෙන මහන්සි වෙන්නෙ.."

සුනන්ද හිස් වීදුරුව පුටුව අසළින් බිම තබයි. "උඹලට වැරදිලා මල්ලි.." යයි කියන්නට ඔහුට සිතෙයි. මේ මහා ප්‍රෝඩාව තුළ මිරිකෙන බණ්ඩාර වැනි අහිංසක අවංකයන් පිළිබඳ උපන් කණගාටුවකින් සිත පිරී යනු ඔහුට දැනෙයි. මේ විෂම ක්‍රියාවලිය තුළ අවංකයනට තැනක් නැති බව කෙසේ කියා දෙන්නද?

"උඹල පලු පැලෙන්ඩ බැන්නට ඇන් ඇම් ල කොල්වින්ල කරන්ඩ හැදුවෙත් ඔිකම තමයි මල්ලි.. මේ ඔක්කොම මහ බොරුවක් .. මේ ප්‍රෝඩාව පස්සෙ දුවල දුවල උඹල අපි හැමෝම දවසක හති වැටිල නවතිනවා.." බොහෝ වේලාවකට පසු සුනන්ද කියයි. ".. නවතිනවාමයි.."

බණ්ඩාර සුනන්ද දෙස බලන්න් විමතියෙනි.

**".. අපිට මේ දේවල් නොතේරෙනව නෙවෙයි සුනන්දයියා.. අපි බලන්නෙ මේ වෙලාවෙ කර අරින්නෙ නැතුව මාන්සි වෙලා අපේ සහෝදරවරු දහ පාළොස් දෙනෙක් වත් පාර්ලිමේන්තුවට යවා ගන්න.. මේ මනාප ක්‍රමය කියන පිස්සු කෙළියෙන් වාසියක් ගන්න... එහෙම වුණොත් මුන්ට ඕනෙ ඕනෙ විදිහට නටන්න ඉඩක් ලැබෙන්නෙ නැහැ.. අර සහෝදරය කියනව වගේ රිමෝට් කන්ට්‍රෝල් එක අපේ අතට ගන්න.. අන්න ඒකටයි මේ දුක් විඳගෙන මහන්සි වෙන්නෙ.."**

"සුනන්දයියා.... අපි දෙපාරක්ම ලෙයින් යකඩින් මර්දනය කරලත් වැටුණෙ නැති ව්‍යාපාරයක්.. අපි ලේසියෙන් අතාරින්නෙ නෑ.."

සුනන්ද සිනාසෙයි. ඒ සිනාව තුළ දරා ගත නොහැකි තරමේ අවඥාවක් සැඟවී ඇතැයි බණ්ඩාරට සිතෙයි.

"උඹලටත් හති වැටෙන දවසක් එනවා මල්ලි.. එනවාමයි.. හෙට නෙවෙන්න පුලුවන්.. අනිද්ද නෙවෙන්න පුලුවන්.. ඒත් දවසක් එනවා.. ඇති වෙලා නැවතිලා ආපහු හැරිලා බලලා දුක් වෙන්න.. ඉතිහාසය පුරාම වුණේ ඒක තමයි.. ඉස්සරහට වෙන්නෙත් ඒකම තමයි.."

000000000

අයෝමා කණ්නාඩිය තුළට එබී බලන්නේ දෙකම්මුලේ තවරා ගත් වත්සුණු නිසි ලෙස තැවරී ඇද්දැයි සැක හැර ගන්නට ය. ප්‍රඥාරත්න මිලට ගෙන දුන් වටිනා සාරියේ පැහැය ඇගේ සමේ පැහැයටම ගැලපෙයි. සාරියේ නැවුම් සුවඳ කාමරය පුරා පැතිරගෙ ාස් ඇතැයි අයට සිතෙයි. ඊයේ "සැලොන් නියෝමි" යේ පැය ගාණක් ගත කර රැළි ඉවත් කළ කොණ්ඩය ඇගේ පෙනුම වඩාත් ඔප් නංවා ඇත.

"යූ ආ වන් ඔෆ් මෝස්ට් බියුටිෆුල් ගර්ල්ස් අයි එවර් සීන් ඩියර්.." කොණ්ඩය සකසන අතර නියෝමි කිරිවන්දල කී සැටි අයෝමාට මතක ය. අයෝමා යළිත් වතාවක් කොණ්ඩය අතගා එහි ඇති මෘදු බව විඳ ගනියි.

"ඔය ළමයා උපාධිය හමාර කළ ගමන් මගේ අමාත්‍යාංශෙ සෙකට්රි කෙනෙක් කරගන්නවා.." ප්‍රඥාරත්න කීවේ ඊයේ සැලොනයේ සිට ආපසු එන අතර ය.

"ඒ ඉතින් ඇමතිතුමා දින්නොත්නෙ.."

ඒ කතාවට ප්‍රඥාරත්න සිනාසෙන්නේ ඇගෙ ' උරහිස මිරිකා ගන්නා අතර ය. එසේ සිදුවන බව කලින් දැන සිටියා සේ රියැදුරු සිරිසෝම කන්නාඩියෙන් පසුපස අසුන දෙස බලන්නේ ප්‍රඥාරත්නට නොපෙනෙන්නට ය.

"අර සාන්තදාන්ත ලෙස මිය පරලොව ගිය උතුමාණන් වහන්සේ මේ ක්‍රමය හදල දීලා ගියේ අපි වගේ අයට සදාකල් දිනන වරමත් දීලනෙ ළමයෝ.. අපට මේ සැප ලබා දුන්න උන්නාන්සේට නිවන් සැපම ලැබෙන්න ඕනෙ.." ප්‍රඥාරත්න මහ හඬින් සිනාසුනේ ය. තවමත් සිය උරහිස මත රැඳී ඇති ඔහුගේ අත දැන් දැන් ඉවතට ගනු ඇතැයි අයෝමා බලා සිටියා ය. "..දිනනවා දිනනවා.. ආයේ ඕකෙ ඔබලා බලන්ඩ දෙයක් නෑ... දිනනවා විතරක් නෙවෙයි.. මට ලැබෙන අමාත්‍යාංශෙ මොකද්ද කියලත් දැන්ම ඉඳන් මං දන්නවා..."

අනාගතය වෙනුවෙන් කරනු ලබන මේ ආයෝජනයෙන් ආලාභයක් නොවනු ඇත යන විශ්වාසය අයෝමාගේ සිත දැඩිව ග්‍රහණය කරගෙන ඇත. රණසිංහ වැනි අලුත් මන්ත්‍රීවරයකුට සිතන්නටත් නොහැකි හාස්කම් ප්‍රඥාරත්න වැනි පළපුරුදු ඇමති වරයකුට කළ හැකි ය. ඒ වෙනුවෙන් කුඩා කැප කිරීමක් කරන්නට ඇගේ සිතේ අකැමැත්තක් නැත.

"අදත් එන්න රෑ වෙනව ද..?" සමදරා කාමරයට එබී අසයි. කන්නාඩිය ඉදිරියේ සැරසෙන සිය දියණියගේ ප්‍රභාමත් රුව ඇගේ සිතේ මහත් සතුටක් ඇති කරයි. මාස කීපයකට පෙර මේ රුව කොතැන සැඟව තිබුණි ද?

"සමහර විට.." අයෝමා කියන්නේ කන්නාඩිය තුළින් මව දෙස බලමින් ය. ".. අද ඇමතිතුමාගෙ සම්බන්ධීකරන රැස්වීම.. ඒකට මං ඉන්නම ඕනෙ.. ඉන් පස්සෙ දිස්ත්‍රික් බලමන්ඩල රැස්වීම් දෙකකුත් තියෙනවා.. මීඩියා වැඩ ටික ඔක්කොම බාර දීල තියෙන්නෙ මටනෙ.. කොහෙද ඉතින්.. ඇමති තුමාට හැම දේකටම මං ඉන්න ඕනෙනෙ.."

වත්තට වාහනයක් ඇතුල් වන හඬ ඇසෙයි. සමදරා දොර වෙතින් මෑත්ව සාලයට යයි. මිදුලේ නවත්වන ප්‍රාඩෝවෙන් බැස එන කර පියවූ සුදු ආරක්ෂක නිල ඇඳුමකින් සැරසුණ තරුණයා ගරු සරු ලෙස සමදරා හා සිනාසෙයි.

"මැඩම් ලෑස්තිද දන්නෙ නෑ.."

"මං විනාඩි පහෙන් එනවා ජයන්ත .." අයෝමා කාමරයේ සිටම කියයි.

අනෙක් පිටුවට